විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

**ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම අරමුණු කරගත් ඉන්දීය උප ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා සංචාරය**

ඉන්දීය උප ජනාධිපති ශ්‍රී සී.පී.රාධක්‍රිෂ්ණන් 2026 අප්‍රේල් 19 වැනි දින සිට 20 වැනි දා දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය. 2024 දෙසැම්බර් මාසයේදී සිදුවූ ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ඉන්දීය සංචාරය, 2025 අප්‍රේල් මාසයේදී සිදුවූ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ ශ්‍රී ලංකා සංචාරය, 2025 ඔක්තෝබර් මාසයේදී සිදුවූ අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරියගේ ඉන්දීය සංචාරය සහ මෑතකදී, එනම් 2026 පෙබරවාරි මාසයේදී නවදිල්ලි නුවර පැවති කෘත්‍රිම බුද්ධි බලපෑම් සමුළුවට ජනාධිපති දිසානායක සහභාගී වීම ඇතුළුව, දෙරට අතර ඉහළ මට්ටමේ සබඳතා තීව්‍ර ව පැවැති පසුබිමක මෙම සංචාරය සිදු විය.

සංචාරය අතරතුරදී, උප ජනාධිපති රාධක්‍රිෂ්ණන්, ජනාධිපති අනුර කුමාර දිසානායක හමුවී සංවර්ධන සහයෝගීතාව, ආර්ථික සහයෝගීතාව, දේශපාලන සබඳතා, බලශක්ති සහයෝගීතාව සහ ධීවර ගැටලුවට තිරසාර විසඳුමකට එළැඹීම පිළිබඳව සාකච්ඡා පැවැත්වීය. දිට්වා සුළි කුණාටුවෙන් පසු ශ්‍රී ලංකාවේ සහන කටයුතු, යළි යථා තත්ත්වයට පත් වීම සහ නැවත ගොඩනැඟීමේ ප්‍රයත්න වෙනුවෙන් ඉන්දියාව ලබා දුන් කාලෝචිත සහාය, ජනාධිපති දිසානායක අගය කළේය.

සංචාරයේ නිරත වූ ඉන්දීය උප ජනාධිපතිවරයාට ගෞරව දැක්වීම සඳහා අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වූ අතර එහිදී දෙරට අතර හවුල්කාරිත්වයේ ඉදිරි ප්‍රගතිය පිළිබඳව ඔවුහු සාකච්ඡා කළහ.

ඉන්දීය උප ජනාධිපතිවරයා කොළඹ පැවැති උත්සව කිහිපයකට ද සහභාගී වූ අතර එහිදී ඔහු දේශපාලන හා ප්‍රජා නායකයින් සහ ඉන්දීය ඩයස්පෝරාව සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වූ අතර කොළඹ ගංගාරාම විහාරස්ථානයේ සහ කතිරේසන් කෝවිලේ සංචාරයක නිරත විය. නුවරඑළියේදී, උප ජනාධිපති රාධක්‍රිෂ්ණන් මහතා ඉන්දීය ආධාර යටතේ ඉදිකරන ලද නිවාසලාභීන් හමුවූ අතර සීතා අම්මන් කෝවිල වෙතද සංචාරයක නිරත විය.

දිට්වා පසු-ප්‍රතිසංස්කරණ පැකේජයක් ක්‍රියාත්මක කිරීම ඇතුළුව දෙරට අතර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම් ගණනාවක් මෙම සංචාරයේදී අත්සන් කෙරිණි. 2023 දී අගමැති නරේන්ද්‍ර මෝදි විසින් දියත් කරන ලද මුලපිරීමක් වන International Big Cat Alliance (IBCA) සන්ධානයට ශ්‍රී ලංකාව නිල වශයෙන් එක් විය.

ධීවර, සත්ව පාලන සහ කිරි නිෂ්පාදන අමාත්‍යාංශයේ සහ පංචායති රාජ් අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය එස්.පී.සිං බාගෙල්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආචාර්ය කේ.ලක්ෂ්මන් සහ ආචාර්ය මේධා විශ්‍රම් කුල්කර්නි ඇතුළු ඉහළ පෙළේ දූත පිරිසක් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කිහිප දෙනෙක්, උප ජනාධිපති රාධක්‍රිෂ්ණන් සමඟ මෙම සංචාරයට එක් වූහ.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත්, කම්කරු අමාත්‍ය සහ මුදල් හා සැලසුම් නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ශ්‍රී ලංකාව නියෝජනය කරමින් රැස්වීම්වලට සහභාගී වූහ.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ 01

2026 අප්‍රේල් 22 වැනි දින


**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச",நாரஹேண்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை
**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk